# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 2024/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 25/07/2024 පැය 0930

## මාධ්‍ය නිවේදනය

**කාන්තාවකගේ ගෙල බැඳි රන් මාලයක් කොල්ලකා පලා යමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පිංදෙණිය පොලිස් ස්ථානය.**

2024.07.24 වන දින දහවල් කාලයේ බුලත්කොහුපිටිය පොලිස් වසමේදී කාන්තාවකගේ ගෙල බැඳි රන් මාලයක් කොල්ලකන ලද පුද්ගලයින් දෙදෙනෙකු යතුරුපැදියකින් පිංදෙණිය දෙසට පලා එන බවට පිංදෙණිය පොලීසියට ලද පණිවිඩයක් ලැබී ඇත.

ඒ අනුව පිංදෙණිය පොලිස් ස්ථානයේ නිලධාරීන් වහාම ක්‍රියාත්මක වී පිංදෙණිය පොලිස් වසමේ බුලත්කොහුපිටිය මාර්ගයේ සිට කෑගල්ල ප්‍රධාන මාර්ගයට සම්බන්ධ වන හීංවැල්ල මාර්ගයේ අටාල පාලම අසලදී සැකකටයුතු යතුරුපැදියක් නැවතීමට උත්සහා කර ඇත. එහිදී යතුරුපැදිකරු විසින් එම ස්ථානයේ සිටි නිලධාරීන් හා එහි තිබූ පොලිස් ත්‍රිරෝද රථයක් හප්පා පලා යාමට තැත් කිරිමේදී නිලධාරීන් විසින් සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 28 හා 40 වයස්වල පසුවන වැලිවේරිය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

සැකකරුවෙකු සන්තකයේ තිබී කොල්ලකන ලද රන් මාලයේ කොටසක්ද අනෙක් සැකකරු සන්තකයේ තිබී හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 202 ක් සමඟ යතුරුපැදියද පොලිස් භාරයට ගෙන ඇත. මෙම සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට යාමේදී නිලධාරීන් දෙදෙනෙකුට තුවාල සිදුවී ඇත.

පිංදෙණිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**